

# රුක් දරුවන් සඟ සතු කරමු
# නිල්ගල වනපෙත සුරකිමු

සෙවණ දුන් ඇසතු රුකට කෘතගුණ සළකනු වස් ගෞතම බුදුන්වහන්සේ සතියක් අනිමිසලෝචන පූජාවෙන් පිදූහ. එලෙස ම, නිල්ගල වනපෙත අවට ගම්වාසීන්ට සෙවණ, දියවර හා සිසිලස දෙන නිල්ගල ඖෂධ වනයට කෘතගුණ සැලකීමක් ලෙස ගම්වාසීන්ගේ ආරාධනයෙන් එම වනයේ රුක් දරුවන් සඟ සතු කිරීම පූජ්‍ය බදුල්ලගම්මන සුමනසාර නාහිමි, කළුපහන පියරතන ස්ථවිර ඇතුළු මහා සංඝරත්නය විසින් සිදු කෙරේ.

**2014 ජනවාරි 11 වන දින උදෑසන 9.30 ට**

## නිල්ගල වනපෙතේ රුක් දරුවන්
## සඟ සතු කිරීමේ මහා පිංකමට
## ඔබත් දායක වන්න.

**ආරාධනය**

සොබාදහම පිළිබඳ ක්‍රියාකාරී බෞද්ධ සහයෝගීතාවය
පරිසර යුක්ති කේන්ද්‍රය
ශ්‍රී ලංකා පරිසර සම්මේලනය
මොරැන්දෑව, ගලහබැද්ද, දිඹුල්දෙන, අලුත්වෙල, දේවාලෙගොඩ,
පඹවැල්කැටිය තුන්ගල්තොට හා තාරාපොල පරිසර හා සමාජ සුබසාධන
සංගමයන් එක්ව

## අතීතයෙන්

ගස් මහණ කිරීම තායිලන්ත බෞද්ධ ස්වාමීන්වහන්සේලා විසින් දැනට දශක තුනක් තිස්සේ සිදුකරගෙන එන වතාවතකි. ගසක් මහණ කිරීම ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට සංඝයා වහන්සේ ඇතුලු පරිසර හිතැතියන් විසින් සිදුකලේ 1997 වසරේදී බදුරලිය - කුකුළෙගම මාර්ගය පුළුල් කිරීමේදි බිම හෙලීමට නියමිතව තිබු අඩි 200 පමන උස "දුන්" ගස මහණ කිරීමෙනි. දෙවන වරට මහණ කල ගස වන්නේ 2008 වසරේදී මාර්ග පුළුල් කිරීමේදි කැපීමට නියමිතව තිබූ බදුල්ල නගර මධ්‍යයේ ඇති රත් හඳුන් ගසයි.

## වර්තමානයෙන්

බිබිල සහ මැදගම වන සංරක්ෂණ කාර්යාල මඟින් ආරක්ෂාව සැපයෙන ගල් ඔය වන ජීවී කලාපය ආශ්‍රිතව ඇති බුද්ධදාස රජ කාලයේ සිට පැවත එන අරළු, බුළු, නෙල්ලි සහිත පතන බිම් වලින් ගහන වූ නිල්ගල වනාන්තරයේ ඇති ඉඩම් අවස්ථාවාදීන් පිරිසක් අත්පත් කරගනිමින් එම වනාන්තරය විනාශ කරමින් සිටී. කොටබෝව, බැදියාව සහ කළුගහවාඩිය යන ග්‍රාමසේවා වසම් වල පිහිටි ගල්ගේ තලාව, දිඹුල්දෙන, තුංගල්තොට, අක්කර 90, අක්කර 60, තාරාපොල, පුබ්බාර වැනි ගම්මාන වල මේ මහා වන මංකොල්ලය සිදුවෙයි.

මෙම නිල්ගල වනාන්තරය ලංකාවේ වඳවීමේ තර්ජනයට භාජනය වී ඇති පඳුරු වටුවා, පතන් කුකුළා, කහ පාද බටගොයා වැනි සතුන්ගේ එකම වාසභූමිය වන අතර කටුස්සන් විශේෂ සහ මැඩියන් විශේෂ කිහිපයක්ද මෙම ප්‍රදේශයට ආවේණික වේ. සේනානායක සමුද්‍රයට ජලය සපයන ගල්ඔයේ ප්‍රධාන අතුගංගාව වන දහමල් ඔය මෙම නිල්ගල වනය හරහා ගලා බසී.

මෙම ප්‍රදේශය අලි ඇතුන්ගේ වාස භූමියකි. මෙම වනාන්තරය මෙලෙස වැන-සීයාමට ඉඩ හැරීමෙන් සේනානායක සමුද්‍රයෙන් පෝෂණය ලබන නැගෙනහිර පළාතේ කුඹුරු ඉඩම් නුදුරු අනාගතයේදී තර්ජනයට ලක්වනු ඇත.

## අනාගතයට

ඌව හා නැගෙනහිර පළාත්වල ගොවි ජනතාවට මහත්වූ සෙනෙහසින් හා දයාවෙන් සෙවන, දියවර හා සිසිලස දෙන නිල්ගල ඖෂධ වනයට ගරු කිරීමක් ලෙස ගම්වාසීන්ගේ ආරාධනයෙන් එම වනයේ රුක් දරුවන් අද දින මෙසේ සඟ සතු කරමු.

# ප්‍රතිඥාව

කිසිදු ලාභාපේක්ෂාවකින් තොරව අප වෙත සෙවණ, දියවර, සිසිල හා වාතාශ්‍රය ලබා දෙන නිල්ගල වනාන්තරය ඉර හඳ පවත්නා තාක් කල් මුළුල්ලේ සුරැකෙනු පිණිස ශ්‍රී සම්බුද්ධ ශාසනයට පූජා කරමු.

මෙහි වසන මිනිසුන් ඇතුළුව සියල් සතුන්ට මෙම වනාන්තරයේ ඇති ගස් වැල් සිඳ නොවනසා උකහා ගත හැකි එලාපල පරිභෝජනය කිරීමේ අයිතිය පමණක් අපි පිළිගන්නෙමු.

අනුරාධපුර රාජධානියේ විසූ බුද්ධදාස මහරජතුමන් විසින් නිර්මාණය කළ මෙම ඔසු වනපෙතට කිසියම් හානියක් කරතොත් එය මෙලොවදීම විපාක දෙන පාපයක් වන බවත් එපමණක් නොව අපායගාමී අකුසලයක් බවත් අපි අවබෝධ කරගෙන සිටිමු.

තවද, පැවිදිබව ලත් උතුමන්ට හිරිහැර කිරීම මහා පාපකර්මයක් බව අපි දනිමු.

වෘක්ෂ දේවතාවුන්ගේ මෙන්ම අපගේ මුතුන්මිත්තන්ගේ ද ආත්මයෝ මෙම වනපෙතට අරක්ගෙන සිටින්නාහුය. ඔවුන්ගෙන් පැවතෙන අප මෙන් අපේ දූ දරුවෝ ද මෙම වනපෙතෙහි ආරක්ෂකයෝ වන්නෙමු.

නිල්ගල වනපෙතෙහි හැදී වැඩෙන ලොකු කුඩා සියලු රුක් මෙවක් පටන් සසුන්ගත හෙයින් මහණදම් පුරන දරුවන් සේ ආරක්ෂා කර ගැනීමට 2014 වැන්නේ දුරුතු මස 11වන ශනි දින නිල්ගල වනපෙතට රැස්ව සිටින අප මෙයින් ප්‍රතිඥා දෙන්නෙමු.

“ජයන්තො බෝධියා මූලේ
සක්‍යානං නන්දිවද්ධනෝ
ඒවං තුයිහං ජයෝ හෝතු
ජයස්සු ජය මංගලම්”




CEJ
Centre For Environmental Justice

පරිසර යුක්ති කේන්ද්‍රය
නො 20 A, කුරුප්පු පාර, කොළඹ 08
දුරකථනය 0112683282 වෙබ් අඩවිය www.ejustice.lk